# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1954/44 - 2016 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා - 2016.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2016 ජනවාරි 08 දින අංක 1948/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පිහිටුවන ලබන නියමයේ උපලේඛනයේ 1 වන තීරයේ "පීඨය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපීව එහි II වන තීරයේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන 10 වන අයිතමයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"11. අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය"

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

03 - 181